**මොනරාගල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 26 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂවලදී කඩා ඉවත්කළ රු.349,337ක ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේදීද මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර නොතිබුණු නිසා ඉඩම් හා ගොඩනැගිලි එම වටිනාකමින් වැඩියෙන් නිරූපනය විය.

(ආ) නව සභා කාර්යාල ගොඩනැගිල්ල හා මොනරාගල සතිපොල ඉදිකිරීමේදී ගෙවා තිබුණු රු.6,401,362ක එකතු කළ අගය මත බදු ප්‍රාග්ධනිතකර තිබුණි.

(ඇ) එකතුව රු.136,330ක් වූ පුස්තකාල රාක්ක 10ක් හා ළමා මේස 02ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඈ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් මොනරාගල මහජන පුස්තකාලයට ලබාදී තිබුණු රු.83,900ක පරිගණකය ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු එකතුව රු.110,700ක්වූ ජල මෝටරය හා ලීටර් 1000 ජල ටැංකිය ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඊ) ගලි බවුසරයට අළුතින්ම සවිකළ රු.95,000ක්වූ වායු සමීකරණ පද්ධතිය ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂවලට අදාළ රු.53,119ක සේවක ඇප තැන්පත් ආයෝජන ගිණුමට හර නොකර සමුච්චිත අරමුදලට හරකර තිබුණි.

(ඖ) ආයෝජනයකර තිබුණු රු.91,120ක සේවක ඇප තැන්පත් ජංගම වත්කම් යටතේ ආයෝජන ලෙස දක්වා නොතිබුණි.

(ඔ) වරිපනම් බදු අය කිරීමේදී ලබාදී තිබුණු රු.170,728ක වට්ටම් වරිපනම් බදු ගිණුම බැර නොකර හිඟ හිටි වරිපනම් බදු ගිණුම බැරකර තිබුණි.

(ඒ) රජයේ ආයතනයක් වෙනුවෙන් ඉටුකර තිබුණු කර්මාන්තයක් සඳහා ලද රු.361,634ක් තැන්පත් ගිණුමට බැරකර කර්මාන්ත ණය හිමියෝ යටතේද ගිණුම්ගතකර තිබුණි.

(ඕ) අනවසර ඉදිකිරීමක් වෙනුවෙන් අය කරන ලද රු.150,000ක පෙරසැරි ගාස්තු ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණි.

## 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### (අ) ලැබිය යුතු ගිණුම්

(i) 1987 වර්ෂයේදී සභාව සතු විදුලි සැපයුම් සේවාව පවරාදීම වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙන් අයවිය යුතු රු.4,771,469ක් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) හඳුනා නොගත් හිඟහිටි වෙනත් ආදායම් ලෙස දක්වා ඇති රු.5,260,292ක ශේෂය සමාලෝචිත වර්ෂය තුලදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### (ආ) ගෙවිය යුතු ගිණුම්

1989 හා 1990 වර්ෂවලදී නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉදිකර සභාවට පවරා තිබුණු කඩකාමර වෙනුවෙන් ගෙවිය යුතු රු.4,872,912ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

## 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,204,777ක වත්කම් විෂයයන් 03ක් හා රු.4,872,912ක වගකීම් විෂයයක් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.4 අනුකූල නොවීම්

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158,161,162,163 හා 166 වගන්ති | 12,016,808 | හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති අංක 214 | - | එක් එක් වර්ෂය අවසානයේදී 203 දරන රීතිය මගින් විධිවිධාන සලසා ඇති ආකාරයේ සමීක්ෂණ මණ්ඩලයක් මගින් ගබඩා ද්‍රව්‍ය පිළිබඳ සත්‍යාක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය | 260,308 | අයනොවී පවතින සේවක ණය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,853,827ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,436,162ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,628,318 | 15,604,660 | 8,204,057 | 7,400,603 | 15,299,210 | 15,260,311 | 5,529,860 | 9,730,451 |
| (ii) | කුලී | - | 7,748,646 | 6,872,640 | 876,005 | - | 8,346,855 | 6,206,145 | 2,140,710 |
| (iii) | බලපත්‍ර ගාස්තු | - | 680,000 | 1,263,850 | - | - | 755,765 | 755,765 | - |
| (iv) | වෙනත් ආදායම් | - | 20,182,480 | 8,758,528 | 11,423,953 | - | 17,238,364 | 10,522,724 | 6,715,640 |
| | **එකතුව** | **15,628,318** | **44,215,786** | **25,099,075** | **19,700,561** | **15,299,210** | **41,601,295** | **23,014,494** | **18,586,801** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රුපියල් මිලියන 44.2ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 25ක් පමණක් රැස්කර තිබුණු අතර එය මුළු බිල්කළ වටිනාකමින් සියයට 57ක් තරම් අඩු අගයක පැවතුණි.

### 2.2.3 වරිපනම් හා බදු

(අ) සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.11,945,130ක් වූ වරිපනම් බදු ආදායමින් වර්ෂය අවසානවන විට රු.5,176,153ක් රැස්කර තිබුණු අතර එය මුළු බිල්කළ වටිනාකමින් සියයට 43ක් තරම් ඉතා අඩු අගයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු.21,011,920ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු.8,995,112ක් රැස්කරගෙන තිබුණි. ඒ අනුව හිඟ වරිපනම් බදු අයවීමේ ප්‍රතිශතය සියයට 43ක් තරම් ඉතා අඩු අගයක පැවතුණි.

### 2.2.4 කුලී

(අ) ඉකුත් වර්ෂයන්ට අදාලව බදුදී තිබුණු දේපල 04කින් අයවිය යුතු රු.770,097ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 159 වගන්තියේ විධිවිධාන අනුව අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන නොතිබුණි.

(ආ) මොනරාගල නගරයේ අංක 27 හා 29 මාළු කඩවලට අදාලව රු.26,237ක් බදු කුලී අයකරගෙන නොතිබුණි.

(ඇ) ගහබඩ අංක 01 කඩකාමරයට අදාලව රු.144,000ක බදුකුලියෙන් රු.101,000ක් වර්ෂය අවසානවන විටත් අයකරගෙන නොතිබුණි.

**2.2.5** <u>වෙනත් ආදායම්</u>

(අ) සමාලෝචිත හා ඉකුත් වර්ෂයන්ට අදාල එකතුව රු.912,950ක ජල ගාස්තු වර්ෂය අවසානවන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) මෝටර් ග්‍රේඩරය කුලියට දීමෙන් වර්ෂ ගණනාවක සිට අයනොවී පවතින රු.70,027ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) 2016 නොවැම්බර් 25 දිනැති අංක 1995 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව සහා බලප්‍රදේශය තුල පවත්වාගෙන යන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා නවාතැන් පොළවල් 04කින් සියයට 01 දක්වා වූ බදු මුදල අයකරගෙන නොතිබුණි.

**2.2.6** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.805,108ක් හා මුද්දර ගාස්තු රු.10,314,821ක් විය.

**2.3** <u>අධිහාර</u>

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුලදී පනවන ලද අධිහාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 665,613ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**03.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 14ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ)** **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

**(ඇ)** **සනඅපද්‍රව්‍ය කළමනාකරණය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/43 දරන 2013 ජුනි 28 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ඌව පළාත් සභා අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනීමට කටයුතුකර තිබුණද, එහි 13 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාර කසළ බදු පනවා සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු කසළ කළමනාකරණ වියදම පියවාගෙන නොතිබුණි.

**(ඈ)** **තිරසාර සංවර්ධන ඉලක්ක**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 මැයි 25 දින වනවිටත් සකස්කර නොතිබුණි.

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

තනතුරු 07කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 33 දෙනෙකු බඳවාගෙන තිබුණි.

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සභාව විසින් බදුදී තිබුණු සියළු කඩකාමර සඳහා බදුකුලී අයකිරීමේදී ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය හා පළාත්පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු කඩකාමර 136ක කුලී තක්සේරු කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) නව බස් නැවතුම්පල කඩකාමර 11ක් බදුදී වර්ෂ 17ක් ගතවී තිබුණද බදුකරුවන් සමග ගිවිසුම්ගතවීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) නව බස්නැවතුම්පල කඩකාමර 03ක් බදුදීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනයකර නොතිබුණි.

## 3.4 ප්‍රසම්පාදනය

### 3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 3.4.2 සැපයීම් හා සේවා

(අ) සභාව විසින් ප්‍රසම්පාදන දැන්වීම් එලකිරීමේදී සැපයුම්කරුවන් සීමාකිරීමට කොන්දේසි ඇතුලත්කර ජාතික තරඟකාරී මිල කැඳවීම් සිදුකර තිබුණි.

(ආ) නිෂ්පාදකගේ හෝ බලයලත් විකුණුම්කරුවකුගේ වගකීම් සහතික නොමැතිව එකතුව රු.863,990ක් වූ පරිගණක 07ක්, ඇඟිලි සලකුණු යන්ත්‍රයක්, ස්කෑන් යන්ත්‍රයක් හා ඩිජිටල් කැමරාවක් මිලදීගෙන තිබුණි.

(ඇ) උපකරණ මිලදී ගැනීමට පෙර තාක්ෂණික පිරිවිතර සකස්කර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබාගැනීමට කටයුතුකර නොතිබුණි.

### 3.4.3 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) ඉදිකිරීම් කර්මාන්ත ප්‍රජාපාදක සමිති වෙත පැවරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා නම්කරන නියෝජිතයකුගෙන් සහ ප්‍රාදේශීය ලේකම්වරයා නම්කරන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ආ) ඉටුකර තිබුණු කොන්ක්‍රීට් මාර්ගවල උරහිස් (sholders) පිරවීම ඇස්තමේන්තුවලට ඇතුළත්කර නොතිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රමාණවත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ) | වත්කම්/දේපළ | (i) | ලේඛනගත නොකිරීම |
| | | (ii) | ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය නඩත්තු නොකිරීම |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | | කාර්ය මණ්ඩලය අනුමතකර නොගැනීම |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම |